**ආයුර්වේද වෛද්‍ය සභාව - 2021**

**----------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටස | | | |
| (i) 11(1)(ඉ) වගන්තිය | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සාමාජිකයන් තිදෙනා පත්කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ආයුර්වේද වෛද්‍යවරුන් තුන් දෙනෙකු වෛද්‍ය සභා සාමාජිකයින් ලෙස පත්කිරීමට 1963 මාර්තු 15 දිනැති අංක 13564 දරන ගැසට් පත්‍රය අනුව ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමක් පැවැත්විය යුතු අතර පැවැත්විය යුතු ඡන්දය පිළිබඳ අමාත්‍යාංශයේ නිර්දේශය මෙතෙක් ලැබී නොමැති බව හා ආයුර්වේද පනත සංශෝධනය කරමින් ආයුර්වේද වෛද්‍ය සභාව ස්වාධීන කළ යුතු අතර ඒ අනුව ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික සංයුතියද සංශෝධනය විය යුතු බව. | ආයුර්වේද පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 18(ඇ) හා (ඈ) වගන්ති | 2021 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු මුළු හෙද නිලධාරීන් සංඛ්‍යාව 39 ක් හා හෙසජ්ජකවරුන් සංඛ්‍යාව 260 ක් වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීනවී නොතිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි හෙද නිලධාරීන් හා හෛෂජ්‍යකවරුන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් වෙතින් තොරතුරු කැඳවා ඇති බව හා හෙද නිලධාරීන් බටහිර වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ඇති බැවින් ඔවුන් ආයුර්වේද වෛද්‍ය සභාවේ | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ලියාපදිංචිවීම ප්‍රතික්ෂේප කර ඇති බව. | |
| (iii) 19(1)(අ) වගන්තිය | සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරීවරයෙකු පත්කළ යුතු වුවද, එම තනතුරට සුදුසු බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ස්ථිර පදනමින් ලේඛකාධිකාරිවරයකු බඳවා ගැනීමට කටයුතු නොකර එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවාගැනීම් සිදුකර තිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා 2021 අප්‍රේල් 05 දින සිට පූර්ණ කාලීන සේවය සඳහා සභාවේ අනුමැතිය මත ලේඛකාධිකාරීවරයෙකු පත් කර ඇති බව හා ලේඛකාධිකාරී බඳවාගැනීම් පටිපාටිය සකස් කිරීමට අදාළ රීති හා සංශෝධන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර අවසන් වාර්තාව ලැබුණු පසු ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ----------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 135 (1) | එක් එක් ගනුදෙනුව නිලධාරීන් දෙතුන් දෙනෙකුගේ මාර්ගයෙන් පරීක්ෂණයට භාජන වන පරිද්දෙන් මුදල් පාලනය සම්බන්ධ රාජකාරි කීපදෙනෙකු අතර බෙදා නියම කළ යුතු වුවද, එයට පටහැනිව සභාවේ සරප් නිලධාරියාගේ සාමාන්‍ය රාජකාරිවලට අමතරව සුළු මුදල් භාරකාරත්වය, සුළු මුදල් වවුචර් පිළියෙල කිරීම හා සුළු මුදල් පොත පවත්වාගෙන යාමද එම නිලධාරියා වෙතම පවරා තිබුණි. | 2022 අප්‍රේල් 18 දින සිට සරප් වශයෙන් කටයුතු කරන නිලධාරිණිය විසින් සුළු මුදල් අග්‍රිමය මූල්‍ය සහකාරවරයාගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යන බව, සුළු මුදල් වවුචර් සකස් කිරීම වෙනත් කළමනාකරණ සේවා නිලධාරිණියක විසින් සිදු කරන බව, රාජකාරී ලැයිස්තු සංශෝධනය කර සුළු මුදල් භාරකාරිත්වය හා සුළු මුදල් වවුචර් සකස් කිරීම ප්‍රධාන කළමනාකරණ සහකාරවරියට පැවරීමට කටයුතු කරන බව හා සියළු සුළු මුදල් ගෙවීම් සිදු කිරීමට පෙර ලේඛකාධිකාරීවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම ඒවා ලබාගත් කාර්යය නිමකළ වහාම සහ දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, 2021 වර්ෂයේ ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම 29 කින් එකතුව රු.133,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2 ක් පියවීමට දින 16 ත් දින 34 ත් අතර කාලයක් ගතකර තිබුණි. තවද, අදාළ කාර්යය ආරම්භ කරන දිනයට පෙර දින අත්තිකාරම නිකුත් කළ යුතු වුවද, කාර්යය ආරම්භවීමට දින 04 ත් දින 06 ත් අතර කාලයකට පෙර එකතුව රු.183,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 4 ක් නිකුත්කර තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 385(1)අ) | බැංකු ගිණුමක් ඇති කල්හි රු.500 ක් හෝ ඊට වැඩි මුදලක් චෙක්පතකින් ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 11 දෙනෙකු වෙත නිකුත්කර තිබුණු මුළු එකතුව රු.1,098,500 ක් වූ ආපදා ණය සඳහා චෙක්පත් නිකුත් නොකර මුදලින් ගෙවා තිබුණි. | කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ පහසුව සඳහා මුදලින් ගෙවා ඇති නමුත් ඉදිරියේ දී මුදල් රෙගුලාසි 385(1)(අ) ප්‍රකාරව රු.500/- වැඩි සෑම ගෙවීමක් සඳහාම චෙක්පතක් නිකුත් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | -එම- |
| (iv) මුදල් රෙගුලාසි 391, 394 හා 396 | 2020 දෙසැම්බර් මාසයේදී නිකුත් කළ නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.5,500 ක් වටිනා චෙක්පත් 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සභාව විසින් පවත්වන ලද පාරම්පරික වෛද්‍යවරුන්ගේ ලිඛිත පරීක්ෂණයට අදාළව නිකුත් කර ඇති චෙක්පත් දෙකක් බව, එම චෙක්පත්වල වටිනාකම නැවත ආදායමට ගැනීමට හා අදාළ පුද්ගලයින් පසුව ඉල්ලීමක් ඉදිරිපත් කළ හොත් නව චෙක්පතක් මඟින් ගෙවීම් සිදු කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා සභා පත්‍රිකාව යොමු කර ඇති බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව 2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 දරන ගැසට් පත්‍රය | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිය වර්ෂ 05 ක් ඉක්ම වූ වෛද්‍යවරු 19,158 ක් සිය ලියාපදිංචිය අලුත් කරගෙන නොතිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් 2014 ඔක්තෝබර් 15 දිනැති 1884/36 අංක දරන ගැසට් පත්‍රය අනුව සෑම වසර පහකට වරක් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍ය හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් දැනුවත් කොට ඇති බව හා ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ නාමලේඛන දිස්ත්‍රික් මට්ටමින් සකස් කොට පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් ඔවුන් දැනුවත් කරමින් ලියාපදිංචිය අළුත් කිරීම සඳහා යොමු කර ගැනීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇති බව. | වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කර ගැනීමට විධිමත් ක්‍රමවේද හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.115,858 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,912 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.69,946 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය දක්වා වෙන්කර තිබුණු රු.756,060 ක විගණන ගාස්තුවලින් රු.155,460 ක් අධි වෙන්කිරීමක් ලෙස, සමාලෝචිත වර්ෂයේ ආදායමට එකතු කර තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

----------------------------------------------------------------------

(අ) සභාවේ වැටුප් හා වේතන සඳහා වූ රජයේ ප්‍රදාන හැර, ඉකුත් වර්ෂයේ රු.6,183,477 ක් වූ සභාවේ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.5,478,047 ක් දක්වා රු.705,430 කින් හෙවත් සියයට 11.4 කින් පහත බැස තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ රු.12,137,565 ක් වූ සභාවේ මුළු වියදම, සමාලෝචිත වර්ෂයේදී රු.12,717,649 ක් දක්වා රු.580,084 කින් හෙවත් සියයට 4.8 කින් ඉහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවේ මෙහෙයුම් වියදම සියයට 46 කින් ඉහළ යාම ඊට හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර සම්බන්ධයෙන්ද, ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන්ද ඉකුත් වර්ෂ 05 දී ලැබී තිබුණු පැමිණිලි 238 කින් පැමිණිලි 41 ක විමර්ශන කටයුතු 2022 අප්‍රේල් 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 50 කින් 18 ක් වැඩිදුර පරීක්ෂාව සඳහා පොලිසිය වෙත යොමුකර තිබුණද එම පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසු විපරම් සිදුකර නොතිබුණි. තවද පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් සිදුකිරීම හා කාලීනව එහි ප්‍රගතිය අගය කිරීම සිදුකළ හැකි වන පරිදි අංගසම්පූර්ණ තොරතුරු පැමිණිලි සටහන් කිරීමේ ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් සිදු කිරීම හා කාලීනව එහි ප්‍රගතිය අගය කිරීම සිදු කළ හැකි පරිදි අංගසම්පූර්ණ තොරතුරු පැමිණිලි සටහන් කිරීමේ ලේඛණයක් 2022 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන බව හා අනෙකුත් විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමටත් කටයුතු කරන බව. | සභාවට ලැබෙන වැදගත් සියලු පැමිණිලි විමර්ශනය කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. පොලිසිය වෙත යොමුකර තිබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් සිදුකළ යුතුය. පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් සිදුකිරීම හා කාලීනව එහි ප්‍රගතිය අගය කිරීම සිදුකළ හැකි වන පරිදි අංගසම්පූර්ණ තොරතුරු පවත්වා ගත යුතුය. |
| (ආ) | පාරම්පරික වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා තැනැත්තෙකුගෙන් අල්ලස් ලබා ගැනීම හා ඒ සඳහා ගුරු වෛද්‍යවරයෙකුගේ අත්සන ව්‍යාජ ලෙස යෙදීම සහ වෛද්‍ය සභා සාමාජික තනතුර අවභාවිතා කිරීම යන චෝදනා සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තාවකින් චෝදනා එල්ල කර තිබුණු වෛද්‍ය සභා සාමාජිකයකු, එකී කාරණයද ඇතුළත් වෛද්‍ය සභාවේ තීරණ ගැනීමේදී අඛණ්ඩව සභා රැස්වීම්වලට සහභාගී කර ගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයක් පැවැත්වෙන බව, විමර්ශන නිලධාරියා සකස් කළ චෝදනා පත්‍රයේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට පෙර චූදිතගෙන් මේ පිළිබඳ ප්‍රකාශ සටහන් කර ගත් බව, මාලේවන සෝභිත ස්වාමීන් වහන්සේගේ පුද්ගලික ලේකම් ලෙස කටයුතු කරන වෛද්‍ය සභා සාමාජික මහතා කැඳවා ප්‍රකාශයක් සටහන් කර ගත් බව හා නැවත විමර්ශන වාර්තාවක් සකස් කර සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව මේ පිළිබඳව සාකච්ඡා කිරීමට සභාව තීරණය කළ බව. | චෝදනාවක් ඉදිරිපත් වූ අයෙකු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී අදාළ චූදිතගේ සෘජු හෝ වක්‍ර බලපෑමට යටත් නොවන ආකාරයට අපක්ෂපාතීව කටයුතු කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2021 දෙසැම්බර් 31 දිනට රු.3,871,274 ක සමුච්චිත ලාභයක් පැවතියද පාරිතෝෂික ආයෝජන ගිණුම හැරුණු කොට ස්ථාවර තැන්පතුවක් හෝ වෙනත් ආයෝජන වත්කමක් ගොඩනගා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ අනාගත ස්ථාවර පැවැත්ම සඳහා ආයෝජන වත්කම් ගොඩනගා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 26,183 ක් බවත්, මියගිය සංඛ්‍යාව 3,800 ක් බවත් වර්තා කර තිබුණු නමුත් මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව සපයා ගැනීමේ ක්‍රමවේදයක් හා මියගිය වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඒ බව මහජනතාවට නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අදාළ ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩ කඩ පවතින බව නිරීක්ෂණය විය. | මියගොස් ඇති බවට මරණ සහතිකය හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සනාථකර ඇති ලියවිල්ලක් හෝ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් සිදු කරනු ලබන දැනුම්දීමක් මත ලියාපදිංචි ලේඛන වලින් නම් ඉවත් කරන බව හා එසේ අවලංගු කර ඇති වෛද්‍යවරුන්ගේ නම් පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් වෙත දැනුම් දීමට කටයුතු කරන බව. | සුදුසු හා නිවැරදි තීරණ ගැනීම සඳහා යාවත්කාලීන හා නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතුය. |
| (ඇ) | පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් පුහුණු කාලය තුළ ඇගයීම සඳහා සකස් කළ නිර්ණායක අනුව සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයැදුම්කරුවන්ගේ පූර්ව ලියා පදිංචියට අදාළ පුවත්පත් දැන්වීම පළ කරන ලද අතර ඒ අනුව අයැදුම්පත් ලැබෙමින් පවතින බව හා මෙම ක්‍රමවේදය 2025 සිට ක්‍රියාත්මක කිරීමට වෛද්‍ය සභාව අනුමත කර ඇති බව. | සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනමින් ආරම්භ කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබුණු ක්‍රියාකාරකම් 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට නොහැකි වී තිබුණු අතර තවත් ක්‍රියාකාරකම් 04 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු විය. | ආයුර්වේද ඖෂධ සංයෝජකයින් හා ආයුර්වේද හෙද නිලධාරීන් වශයෙන් ලියාපදිංචිවීම සඳහා 2021 වර්ෂයේ ඉල්ලුම්පත් ඉදිරිපත් නොවීමද, කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ජනතාව එක්රැස් කිරීමේ අපහසුතාවය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මතද, ඇතැම් ක්‍රියාකාරකම් සියයට 50 කට වඩා අඩුවෙන් ක්‍රියාත්මක කිරීමට සිදු වූ බව. | |
| (ආ) | ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරීන් හා භෛසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට පාරම්පරික වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචියට අයදුම්පත් බාරගැනීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, ලිඛිත පරීක්ෂණ පැවැත්වීම යනාදියට කාල සීමා සහිත සැළසුම් සකස් කර එය ක්‍රියාකාරී සැළැස්මටද ඇතුළත් කර ඇති බව. | ක්‍රියාවලින්හි කාර්යයන් ඇගයීමට කාර්යසාධන දර්ශක පිහිටුවා සමාලෝචනය කළ යුතුය. |

4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව යටතට ගැනෙන කරුණු සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සභා සාමාජිකයින් දැනුවත් කොට ඇති බව හා ක්‍රියාත්මක විය යුතු වැඩ සටහන් සකස් කිරීම සඳහා කටයුතු කරන බව. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |